*සැ. යු.*- 2017.11.24 දින පළ වූ අංක 2,047 දරන *ගැසට් පත්‍රයේ* III කොටස පළ නොවිය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,048 - 2017 නොවැම්බර් මස 30 වැනි බ්‍රහස්පතින්දා - 2017.11.30**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

## IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)

| | පිටුව |
|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... ... | — |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — |
| වෙනත් පත්කිරීම් ... ... ... ... | — |
| පළාත් සභා නිවේදන ... ... ... ... | 3234 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| තනතුරු ඇබෑර්තු ... ... ... ... | — |
| විභාග විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... ... | — |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | — |

*සැ. යු.* - සුරුකුම්පත් විනිමය පනත් කෙටුම්පත 2017 නොවැම්බර් මස 17 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2017 දෙසැම්බර් මස 22 වැනි දින පළ කරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2017 දෙසැම්බර් මස 08 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.)*

2017 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

3233- B 81231 — 5,403 (2017/11)
F 1 -

# පළාත් සභා නිවේදන

**1946 අංක 57 දරන පොදු සුසාන සහ පුද්ගලික සුසාන පිළිබඳ ආඥාපනතේ II පරිච්ඡේදයේ 5 (1) යටතේ කරනු ලබන දැන්වීම**

1989 අංක 12 දරන පළාත් සභා (අනුශාංගික විධි විධාන) පනතේ 2 වැනි වගන්තියේ II වැනි උප වගන්තියේ (අ) ඡේදය සමග කියවිය යුතු 1946 අංක 57 දරන පොදු සුසාන භූමි සහ පුද්ගලික සුසාන භූමි පිළිබඳව ආඥාපනතේ II වැනි පරිච්ඡේදයේ 5(1) වගන්තියෙන් පළාත් සභාවේ පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, වයඹ පළාතේ පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය සහ පළාත් පාලන විෂයභාර අමාත්‍ය වන දසනායක ගුණරත්න බස්නායක මුදියන්සේලාගේ ධර්මසිරි දසනායක වන මා විසින් වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ ඉබ්බාගමුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි පහත උපලේඛනයේ සඳහන් සුසාන භූමිය මළමිනී වැළලීම හෝ ආදාහනය කිරීම පිණිස පොදු සුසාන ලෙස මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

දසනායක ගුණරත්න බස්නායක මුදියන්සේලාගේ ධර්මසිරි දසනායක,<br>
වයඹ පළාතේ මුදල් හා ක්‍රම සම්පාදන, ඉංජිනේරු සේවා,<br>
නීතිය හා සාමය, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන,<br>
ආර්ථික ප්‍රවර්ධන, පරිසර කටයුතු, ජල සම්පාදන හා<br>
ජලාප්‍රවහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍ය,<br>
වයඹ පළාත් සභාව.

2017 නොවැම්බර් මස 02 වැනි දින,<br>
කුරුණෑගල ප්‍රධාන අමාත්‍ය කාර්යාලය.

## උපලේඛනය

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, හිරියාල හත් පත්තුවේ, මහගල්බොඩ එගොඩ කෝරලයේ, ඉබ්බාගමුව ප්‍රදේශීය සභා බල ප්‍රදේශයේ, ගනේවත්ත ප්‍රදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 461, නිකදළුපොත ග්‍රාම නිලධාරී වසමට අයත්, ගැටකුලාව, මලස්න යන ගම්වලට අසුව පිහිටි, ඒ. එස්. කුමාර පරණගේ බලයලත් මානක නිලධාරී තැන විසින් මැන සකසා සහතික කළ අංක 2014/52 සහ 2014/04/07 දින දරන පැලැනේ ප්‍රකාර, කැබලි අංක 02 දරන, "කුඹුක්ගහමුල හේන්යාය සහ පාර අද්දර හේන්යාය" කියන, ඒකාබද්ධ ඉඩම වන රූඩ් තුනකුත්, පර්චස් නවයක් (අක්.0, රූ.03, පර්.9.0) *හෙවත්* හෙක්ටයාර් 0.3263 ක් විශාල බිමට මායිම් ලෙස උතුරට : ඇළ සහ කතෝලික දේවස්ථානය පිහිටි ඉඩම ද, නැගෙනහිරට : අමරසේන නියදඩුපොළ හිමිකම් කියන ඉඩම ද, දකුණට : කිරිකෝන්ගහ සහ අමරසේන නියදඩුපොළ හිමිකම් කියන ඉඩම ද, අ.ග.පි. 1353 හි කැබලි අංක ඩබ්.966එෆ්. හි කොටසක් ද, බස්නාහිරට : අල්විස් හිමිකම් කියන ඉඩම සහ කතෝලික දේවස්ථානය පිහිටි ඉඩම සහ එකී පැලැනේ කැබලි අංක 01 දරන මාර්ගය ද, මායිම් වන නිකදළුපොත, හිරිපිටිය සුසාන නැමැති ඉඩම.

11-1197

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.